# වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින් වෙතින් 2021.06.07 දින තෙක් අයදුම්පත් භාරගනු ලැබේ.

**ස්ථිර තනතුරු**

1. කථිකාචාර්ය (පරිවාස), කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය – II/I ශ්‍රේණිය – සායනික විද්‍යා හා රසායනාගාර විද්‍යා.
2. කථිකාචාර්ය (පරිවාස) කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය – II/I ශ්‍රේණිය – වෛද්‍ය විද්‍යා අධ්‍යාපනය

**වැටුප් පරිමාණ :**

අ. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය – රු. 91310–7X2170–106500 මසකට U-AC3(1) 2020.01.01 දිනට.

ආ. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය – රු. 79360 – 11X1630–97290 මසකට U-AC3(ii) 2020.01.01 දිනට

ඇ) කථිකාචාර්ය (ස්ථිර නොකළ) රු. 69580–5X1630–77730 මසකට U-AC3 (iii) 2020.01.01 දිනට

ඈ) කථිකාචාර්ය (පරිවාස) රු. 54600–10X1335–67950 මසකට U-AC3(iv) 2020.01.01 දිනට

ඉහත වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් අනුමත දීමනාද ගෙවනු ලැබේ.

**විශේෂ සටහන්**

වෛද්‍ය උපාධිය (MD) සහ මාණ්ඩලික සහතිකය ලබා ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ.

විශ්‍රාමික සෞඛ්‍ය අමාත්‍යාංශ උපදේශකයින්ගේ හා සප්ත වාර්ෂික නිවාඩු මත සිටින විද්‍යාර්ථීන්ගේ අයදුම්පත් කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම සඳහා සළකා බැලේ.

සප්ත වාර්ෂික නිවාඩු පිළිබඳ හිමිකම

ඉහත තනතුරු දරන්නන් වසර 7 ක සේවා කාලය සම්පූර්ණ කිරීම මත සම්පූර්ණ වැටුප් සහිත වසරක හෝ වැටුප් රහිත වසර දෙකක කාලයක සප්ත වාර්ෂික නිවාඩු සඳහා සුදුසුකම් ලබයි. සප්ත වාර්ෂික නිවාඩු මත විදේශ ගතවන අය ඔහුගේ/ ඇයගේ සහ ඔහුගේ/ ඇයගේ කලත්‍රයාගේ සම්පූර්ණ පැකේජය ගමන් වියදම් ලැබීමටද සුදුසුකම් ලබයි.

**වැදගත්**

කරුණාකර, ඔබගේ වෘත්තීය අධ්‍යාපනික සහ වෙනත් සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවන්න. උසස් අධ්‍යාපන ආයතන, රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම් කළ යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

රැකියා විස්තර සහ අයදුම්පත් ආකෘතිය ඇතුළු වැඩිමනත් විස්තර වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි අයදුම්පත් ඉදිරිපත් කිරීම ආයතනයේ වෙබ් අඩවිය මගින් ලබාගත හැකිය. (pgim.cmb.ac.lk)

යථා පරිදි සම්පූර්ණ කළ අයදුම්පත් අදළ සහතිකවල පිටපත් සමග 2021.06.07 දින හෝ ඊට පෙර dr@pgim.cmb.ac.lk යන විද්‍යුත් තැපැලට යොමු කිරීම හෝ කොළඹ 07, මහාචාර්ය නන්දදාස කෝදගොඩ මාවත, නො. 160 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී වෙත ලියාපදිංචි තැපැලෙන් යොමු කිරීම හෝ ගෙනැවිත් භාරදීම හෝ කළ යුතුය. විද්‍යුත් තැපෑලේ විෂයය ලෙස හා ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

**අධ්‍යක්ෂ, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**නො. 160, මහාචාර්ය නන්දදාස කෝදාගොඩ මාවත, කොළඹ 07.**

**2021.05.16**